# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1923/63 - 2015 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : DSO/LND/0-1-05/FI/02.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දෙබැද්ද ග්‍රාම නිලධාරී වසමේ කන්දෙබැද්ද ග්‍රාමයෙහි (අ.ග.පි. 171 හා එච්/ඕකේ/2012/756) පහත උපලේඛනයේ විස්තර සඳහන් ඉඩම.

**කැබලි අංකය 1675**

ඉඩමේ නම: බිබුලහේන; හිමිකම් කියන අය: ගමගේ පේමාවතී හිමිකම් කියනු ලබන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0535.

**කැබලි අංකය 1676**

ඉඩමේ නම: බිබුලහේන; හිමිකම් කියන අය: ගමගේ පේමාවතී හිමිකම් කියනු ලබන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0451.

**කැබලි අංකය 1677**

ඉඩමේ නම: බිබුලහේන; හිමිකම් කියන අය: ගමගේ පේමාවතී හිමිකම් කියනු ලබන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0617.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 සැප්තැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.00ට ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 අගෝස්තු මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

කාංචනා කේ. තල්පාවිල,<br>
ප්‍රාදේශීය ලේකම්.<br>
ඕකෙවේල,<br>
හම්බන්තොට.

2015 ජූලි මස 13 වැනි දින,<br>
ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07—1460


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 21942 - 14 - (2015/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.